www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඩිමොක්‍රැටික් කොන්ග්‍රස් සභිකයෙක් අනිවාර්ය යුද සේවය යලි ඇති කිරීම සඳහා කැඳවුම් කරයි

## Democrat Congressman calls for reinstating the draft

**ජෝ. කේ විසිනි**
**2006 නොවැම්බර් 21**

ඉරාකයේ යුද්ධයට එරෙහිව පිටාර ගලන්නා වූ මහජන විරුද්ධත්වය ප්‍රකාශයට පත් වූ, එක්සත් ජනපද අන්තර්වාර මැතිවරනයෙන් සති දෙකක් ඉකුත් වන විට වොෂින්ටනයේ දේශපාලන විවාදය සැලකිය යුතු අයුරින් වෙනස් මගක් ගෙන තිබේ. යටපත් වී ඇත්තේ නුදුරු අනාගතයේ දී පාර්ශ්වික හමුදා ඉවත් කර ගැනීමක් හෝ සිදු විය හැකිය යන්න පිලිබඳ සාකච්ඡාවයි. දේශපාලන සංස්ථාපිතය තුල ප්‍රධාන ප්‍රශ්නය වී තිබෙන්නේ එක්සත් ජනපදය විසින් ඉරාකය තුලට තව තවත් හමුදා යවනු ලැබිය යුතු ද, එසේ නම් ඒ කොපමන ද, කොපමන කාලයකට ද යන්නයි.

විවාදය තුල ඉස්මතු වී ඇති මූලික ගැටලුවක් නම් දීර්ග කාලයකට ඉරාකයට යැවීමට තරම් ප්‍රමානවත් එක්සත් ජනපද සොල්දාදුවන් සංඛ්‍යාවක් මිලිටරිය තුල නොමැති වීම යි. පසු ගිය සතියේ සෙනෙට් සභාවේ සන්නද්ධ සේවා කමිටුව ඉදිරියේ ඉරාකයේ සිටින හමුදාව වැඩි කිරීමේ යෝජනා පිලිබඳ ප්‍රශ්න කිරීමේ දී, මැද පෙරදිග එක්සත් ජනපද හමුදා අනදෙන නිලධාරී ජෝන් අබිසයිඩ් විසින්  මතු කරනු ලැබූ ප්‍රධාන විරුද්ධත්වය මෙය යි.

මෙම සන්දර්භය තුල, පාර්ලිමේන්තු ක්‍රම හා විධි කමිටුවේ නව සභාපති, ඩිමොක්‍රැටික් පාක්ෂික, කොන්ග්‍රස් සභික චාල්ස් රැන්ගල්, මිලිටරි සේවය අනිවාර්ය කිරීමේ සිය යෝජනාව බලගතු අයුරින් යලි ඉදිරිපත් කලේ ය.

අනිවාර්ය මිලිටරි සේවය පිලිබඳ රැන්ගල්ගේ යෝජනාව අලුත් එකක් නො වේ. රැන්ගල්ගේ ප්‍රකාශයන් සඳුදා සංගත මාධ්‍ය තුල බැරෑරුම්ව ප්‍රචාරය කෙරිනි. සීඑන්එන්හි "සිටුවේශන් රූම්" (තත්ව කුටිය) වැඩ සටහන තුල ඔහු සමග සාකච්ඡාවක් කෙරුනු අතර සවස ප්‍රවෘත්ති තුල හා මුද්‍රිත මාධ්‍යය තුල ඔහුගේ ආස්ථානය කැපීපෙනෙන ලෙස වාර්තා කෙරිනි.

සීබීඑස්හි "ෆේස් ද නේෂන්" (ජාතිය මුහුනදෙන්න) නම් ඉරිදා වැඩ සටහනේ දී රැන්ගල්, බොබ් ෂීෆර්ට කියා සිටියේ "ඔබ ඔබගේ ජීවිතය පරදුවට තබන්න", අනිවාර්ය යුද සේවය කැඳවීම ඔහු බැරෑරුම්ව සලකා බලන බවයි. "නව සැසිවාරය ඇරඹූ විගස මා එම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නෙමැ"යි ඔහු කීවේ ය.  පසුගිය වසර තුන හමාරක කාලය තුල එම පනත් කෙටුම්පතෙහි අනුවාදයන් දෙකක් රැන්ගල් විසින් ඉදිරිපත් කෙරිනි. එකක් අදාල වන්නේ වයස 18 සහ 26 අතර පිරිමින්ට හා ගැහැනුන්ට වන අතර අනෙක වයස 18 හා 42 අතර පිරිමින්ට හා ගැහැනුන්ට අදාල වේ.

"අනිවාර්ය යුද සේවය පැවතුනා නම්, විශේෂයෙන් ම කොන්ග්‍රසයට ඉදිරිපත් කෙරුනු නිස්සාර සාක්ෂ්‍ය මත මෙම ජනාධිපති හා මෙම පරිපාලනය ඉරාකය කිසිවෙකුටත් අනුගමනය නොකරනු ඇති බවට මගේ සිතෙහි කිසිම සැකයක් නැතැ"යි ඔහු "ෆේස් ද නේෂන්" තුල දී කියා සිටියේ ය. "කොන්ග්‍රසයේ සහ පරිපාලනයේ සාමාජිකයින් ඔවුන්ගේ සමාජයේ දරුවන් අනතුරට පත් වනු ඇතැයි සිතුවේ නම්" ආක්‍රමනයක් කිසි විටෙකත් සිදු නොවනු ඇත.

එනයින් රැන්ගල්ගේ අනිවාර්ය යුද සේවය යලි පිහිටුවීම සඳහා කැඳැවුම පදනම් වන්නේ එකිනෙකට සම්බන්ධිත සාධක දෙකක් මත යඃ 1) අනිවාර්ය යුද සේවය පවතින විට මහජන විරුද්ධත්වය පහසුවෙන්ම ඇවිස්සෙන බැවින් යුද්ධය හටගැනීමේ ඉඩකඩ අඩුවේ. 2) තමන්ගේම දරුවන්ගේ ජීවිත අනතුරේ හෙලන්නාවූ යුද්ධයකට කොන්ග්‍රස් සභිකයින්ගේ සහය ලැබීමේ ඉඩකඩ අඩු ය.

පලමු සාධකයට ප්‍රතිචාර ලෙස කිවහැක්කේ අඩුව ඇත්තේ මහජන විරුද්ධත්වය නොවන බවයි. ඉරාකය ආක්‍රමනය කිරීම කිසි විටෙකත් ජනප්‍රිය නොවුනු අතර මේ අවස්ථාවේදී ඇමරිකානු මහජනතාවගෙන් සැලකිය යුතු බහුතරයක් එම රටින් එක්සත් ජනපද හමුදා ඉවත් කර ගැනීමට පක්ෂව සිටිති. අනිවාර්ය යුද සේවයෙන් තොර මහජන මතයෙහි ස්වභාවය එයයි. කෙසේ වෙතත් මෙම විරුද්ධ පාර්ශ්වය දේශපාලන පක්ෂ දෙකට ම විරුද්ධව දේශපාලන සංස්ථාපිතය තුල බැරෑරුම් ප්‍රතිරූපයක් අත් කර නොගනියි.

පක්ෂ දෙක යුද්ධයට විරුද්ධ කරවීම සඳහා අනිවාර්ය යුද සේවය ඇති කිරීම අවශ්‍ය නම්, එය අනිවාර්ය යුද සේවය සඳහා පාවිච්චි කල හැකි තර්කයක් නො වේ.

ඒ වෙනුවට, එමගින් ප්‍රදර්ශනය වන්නේ දේශපාලන පක්ෂ දෙකට ම විරුද්ධව දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමේ දැවෙන අවශ්‍යතාවය යි.

යථා වසයෙන් ගත් කල රැන්ගල්ගේ තර්කය අතිශයොක්තියක් මෙන්ම අති සරල එකකි. තනි තනි දේශපාලනඥයන්ගේ මනෝමූලික බියවීම්වලට වඩා ගැඹුරු කරුනු අධිරාජ්‍යවාදී මිලිටරිවාදය පුපුරා යාම තුල ගැබ්ව පවතිති. පාලක සංගත ප්‍රභූවන්ගේ නියෝජිතයින් ලෙස ඔවුන්ගේ තීරන අවසන් විග්‍රහයේ දී තීන්දු වන්නේ පන්ති වුවමනාවන් මතය. කොන්ග්‍රසය, පාලක සංගත හා මූල්‍ය ප්‍රභූවන්ගේ අවශ්‍යතාවන්ට සම්පූර්නයෙන්ම යටපත් වූ ආයතනයකි. මිලිටරි සේවය අනිවාර්ය කිරීමක දී, මෙම ප්‍රභූව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ගෝලීය එල්ලයන් අත් කර ගැනීමේ ඉසව්වට සූදානම් දේශපාලනික පුද්ගලයින් සොයා ගනු ඇත. තමන්ගේ දරුවන්ගේ ජීවිත පිලිබඳව බියෙන් සැලෙන්නවුන්සේ පෙනෙන පුද්ගලයින්, ඔවුන්ගේ මැතිවරන කොට්ඨාශ පිලිබඳව සඳහන් නොකල ද, තද පිට කොන්දක් සහිත දේශපාලනඥයින්ගෙන් විස්ථාපනය වනු ඇත. වත්මන් කොන්ග්‍රසය තුල එවන් තද සිත් ඇති පුද්ගලයින්ගෙන් අඩුවක් නැත. මිලිටරිය තුල තම පුතුන් දෙදෙනෙකු සිටිය දී ඉරානයට තවතවත් හමුදා යැවීම පිලිබඳව අතිශයින්ම ප්‍රබල හඬක් නගන ජෝන් මැක්කේන්ගේ නිදසුන පිලිබඳව සඳහන් කිරීම පමනක් වුව ද යමෙකුට සෑහෙයි.

ඉරාකය හා ඇෆ්ගනිස්ථානය ආක්‍රමනය කිරීම මගින් ප්‍රකට වුනේ මැද පෙරදිග හා මධ්‍යම ආසියානු ප්‍රදේශ තුල පවතින ස්වාභාවික සම්පත් සමගින්ම එම ප්‍රදේශ මත ආධිපත්‍යය තහවුරු කර ගැනීමට ඇමරිකානු පාලක ප්‍රභූවට පවතින මූලික අවශ්‍යතාවයි. පරදුවට තැබී ඇත්තේ ඇමරිකානු ධනවාදයේ භූ-මූලෝපායික තත්වයයි. කොන්ග්‍රස් සභිකයින් තමන්ගේ හා තම අසල්වාසින්ගේ දරුවන් පිලිබඳව පවතින සැලකිල්ල නිසා මෙම මූලෝපායික අවශ්‍යතාව නොතකා හරින්නේ යැයි සිතීම දේශපාලන බොළඳකමකි.

තව දුරටත්, රැන්ගල්ගේ තර්කනය ඓතිහාසික අත්දැකීම් මගින් ප්‍රතික්ෂේප කෙරේ. පලමු ලෝක යුද්ධයේ දී හා දෙවන ලෝක යුද්ධයේ දී කොන්ග්‍රසය විසින් අනිවාර්ය යුද්ධ සේවය හඳුන්වා දෙනු ලැබුවේ සැලකිය යුතු විරුද්ධත්වයක් මධ්‍යයේ ය. අනිවාර්ය යුද සේවය හඳුන්වා දුන් පසුව යුද්ධයට එරෙහි සියලු මහජන විරුද්ධත්වය නිර්දය ලෙස පාගා දැමීම සඳහා නීතිමය අවකාශයක් එමගින් සැපයුනි. එක්සත් ජනපද ඉතිහාසයෙහි කතා කිරීමේ නිදහසට දරුනුතම ප්‍රහාරය එල්ල කිරීමට වේදිකාව සැකසුනේ පලමු ලෝක යුද්ධයේ දී ඉදිරිපත් කෙරුනු අනිවාර්ය යුද සේවයට පැවති විරුද්ධත්වය ය යන්න පිලිබඳව රැන්ගල් නොදැන්වත් සේ ය. අනිවාර්ය යුද සේවයට බාධා කිරීම මත යුද විරෝධීන්ට එරෙහිව ආන්ඩුව විසින් නඩු පැවරූ, දෙවන ලෝක යුද්ධයේ දී හා වියට්නාම් කාලයේ දී, මෙම අත්දැකීම නැවත නැවතත් අත් විඳීමට ලැබිනි. මොහොමඩ් අලි නීතිය ඉදිරියට ගෙන ඒම ඒ අතුරින් වඩාත් ජනප්‍රිය වූ එක් ඉලක්කයක් විය.

රැන්ගල්ගේ තර්කයන්ගෙන් බොහොමයක් හිස් ප්‍රජාතන්ත්‍රික ජනප්‍රිය පද හා සම්බන්ධ ය. නිදසුනක් ලෙස අනිවාර්ය යුද්ධ සේවය පැවතීම යම් ආකාරයක "යුද්ධයටකැප වීමේ සමානත්වයක්" ජනිත කරන්නේ ය යන්න දක්විය හැකි ය. එනමුදු මෙම තර්කය පරදුවට තැබී ඇති මූලික ප්‍රශ්නයෙන් බැහැර වූවකි. අනිවාර්ය යුද සේවය ඇති කිරීම මගින් ඉරාකය තුල හමුදා රඳවා තැබීමේ සාපරාධී බව දනට වඩා අඩු කරන්නේ නැත. පොහොසතුන්ගේ දූවරුන්ට හා පුතුන්ට, ඉරාකය තුල මිනීමැරීමට හෝ ඝාතනයට ලක්වීමට, සැලැස්වීම මගින් යුද්ධයේ ම්ලේච්ඡ බව හෝ අනීතික බව වෙනස් නොවනු ඇත. තෙල් සම්පත් අත්පත් කර ගැනීම සඳහා යොමුවුනු මෙම ගසා කෑමේ යුද්ධයන්හි සටන්වැදීමට කිසිවකුට බල කල යුතු නැත.

අනෙක් අතට අනිවාර්ය යුද සේවය මගින් ඇමරිකානු ධනවාදයේ පන්ති ස්වභාවය සැලකිය යුතු අයුරින් වෙනස් නොකරනු ඇත. එක්සත් ජනපදයට සමානත්වය අවශ්‍ය වන්නේ මරනයේ දී නොව ජීවත් වීම සඳහා ය.

ඉරාකය තුල එක්සත් ජනපද හමුදා වාඩිලා සිටීමට ඩිමොක්‍රටික් පක්ෂය සහය දෙන්නේ ය යන මූලික කරුන සාකච්ඡාවට ලක් වීම වැලැක්වීම, අනිවාර්ය යුද සේවය පිලිබඳ රැන්ගල්ගේ තර්කය ගොඩනැගීමේ ප්‍රධාන උවමනාව විය. වාඩිලා ගැනීම අවසන් කල යුතු යයි රැන්ගල් කියා නො සිටි අතර එක්සත් ජනපද මිලිටරි ක්‍රියාන්විතයන් සඳහා මූල්‍ය කප්පාදු කිරීමට සහය දීම ඔහු සුවිශේෂවම ප්‍රතික්ෂේප කලේ ය.

රැන්ගල් යථා ලෙස යුද්ධයට විරුද්ධ නම්, යුද්ධය අවසන් කිරීම සඳහා, අනිවාර්ය යුද සේවය යොදා ගන්නවාට වඩා ඍජු ක්‍රම තිබේ. මිලිටරිය තුල සිටින කම්කරු පන්තික ජනතාවගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිචාරය නම් තව තවත් පුද්ගලයන් මිලිටරිය තුලට කොටුකර ගැනීම නොව ඉරාකයෙන් හා ඇෆ්ගනිස්ථානයෙන් එක්සත් ජනපද හමුදා වහාම ඉවත් කර ගන්නා ලෙස බල කිරීමයි.

මෙය රැන්ගල්ගේ ආස්තානය නොවන අතර ඔහුගේ පක්ෂය විසින් සහමුලින්ම ප්‍රතික්ෂේප කරන ලද ආස්තානයකි.

වෛෂයික දෘෂ්ටිකෝනයෙන් සලකා බැලූ කල රැන්ගල්ගේ හිස්-ජනප්‍රිය තර්කයන් වංක ඒවා වෙයි. කොන්ග්‍රස් සභිකයන්ගේ ආස්තානය සේවය කරන්නේ අනිවාර්ය යුද සේවයේ මූලික අවශ්‍යතාව ආවරනය කිරීමට ය. එම අවශ්‍යතාව නම් ඉරාක වාඩිලා ගැනීම

හා අනාගත යුද්ධ පුලුල් කිරීම සඳහා මිලිටරියේ ප්‍රමානාත්මකව ප්‍රසාරනය කිරීමයි.

ඉරු දින "ෆේස් ද නේෂන්" වැඩ සටහනට ඔහු පැවසූ පරිදි, "අප ඉරානයට හා උතුරු කොරියාවට අභියෝග කරන්නට යන්නේ නම්, හා සමහරුන් විමසන පරිදි ඉරාකයට තව හමුදා යවන්නේ නම් අනිවාර්ය යුද්ධ සේවයෙන් තොරව එය කල නොහැක... යමකු අනිවාර්ය යුද්ධ සේවයට සහය නොදෙමින් යුද්ධයට සහාය දෙන්නේ කෙසේ දැයි මට නොපෙනේ"

2005 මැයි මස නිකුත් කල ප්‍රකාශයක ඔහු මෙසේ සඳහන් කලේ ය. "මෙම යුද්ධයට අප පිවිසුනේ අවශ්‍ය තරම් හමුදා පිරිස් ප්‍රමානයකින් තොරව බව සැම කෙනෙක් ම දනිති. දැන් ගැටලුව වන්නේ දැනටමත් භූමියේ සිටින හමුදා කාන්ඩයක් තුල නිලතල පිරවීම යි. ක්ෂේත්‍රය තුල හමුදා රැඳවීමට අපට හැකිව ඇත්තේ හමුදා යෙදවීම් දීර්ග කිරීම, ප්‍රහාරාත්මක මෙහෙයුම්වල ඉහත දී යෙදුනු පලපුරුදුකරුවන් යලි කැඳවීම, හා ස්වේච්ඡා (රිසර්ව්) හමුදා මත දරා ගත නොහැකි තරමේ බර පැටවීම මගිනි.

විශාලිත මිලිටරියක් අවශ්‍ය බව දේශපාලන සංස්ථාපිතය තුල සාමාන්‍යයෙන් පිලිගන්නා අදහසයි. රැන්ගල්ගේ ප්‍රකාශයන් මාධ්‍යය තුල ප්‍රමුඛ අයුරින් සාකච්ඡාවීමට හේතු වන්නේ; ඇමරිකානු මිලිටරිය දැනටමත් හැකි පමනට ද වඩා පුලුල් කර ඇති කොන්දේසි තුල අනිවාර්ය යුද සේවය පිලිබඳ සාකච්ඡාව යුක්තිසහගත කිරීමට තුඩු දෙන අතර ඒ සමග ම ඉරාකය තුල හමුදා ප්‍රමානය ඉහල දැමීම හා ඉරානයට එරෙහිව සිදුවියහැකි ප්‍රහාරයක් සඳහා සූදානම් වීම එල්ල කර ගනිමින් හමුදා සංඛ්‍යාව ඉහල දමා ගැනීමේ අවශ්‍යතාවය පිලිබඳව පාලක ප්‍රභූව තුල පවතින සාකච්ඡාව ය. රැන්ගල්ගේ ආස්තානය මහජන ප්‍රතිචාරය මැන බැලීමේ අත්හදා බැලීමක් හා මෙම දිශාවට ගමන් කිරීම සඳහා මහජන මතය සකස් කිරීමක් ද වෙයි.

ඩිමොක්‍රටික් නායකත්වය ක්ෂනිකවම රැන්ගල්ගේ යෝජනාවට විරුද්ධත්වය ප්‍රකාශ කල ද, යම් ආකාරයක අනිවාර්ය යුද්ධ සේවාවක අවශ්‍යතාව පිලිබඳව ඩිමොක්‍රටික් පක්ෂය තුල දීර්ග සාකච්ඡාවක් පැවැත්විනි. මැතිවරනයට පෙර නිකුත් වූ ඩිමොක්‍රටික උපායකරුවන්ගේ පොත් කිහිපයක මෙම අවශ්‍යතාව මතු කර තිබිනි. වුවමනාවෙන් හා අතිශයින් සවිඥ්ඥානිකව මෙම කරුන දේශපාලන වාදයට හඳුන්වාදීමක් ලෙස රැන්ගල් තම ප්‍රකාශය ඉදිරිපත් කලේ ය.

පන්ති සවිඥ්ඥානික කම්කරුවන් හා යුද විරෝධී ශිෂ්‍යයින් හා තරුන ජනයා රැන්ගල්ගේ පම්පෝරිය විනිවිද දැකිය යුතු අතර යුද්ධය හා අනිවාර්ය යුද සේවය යලි හඳුන්වා දීමේ සැලසුම යන දෙකට ම ඔවුන්ගේ විරුද්ධත්වය නොසැලී පවත්වා ගත යුතු ය.

© www.wsws.org